･ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2193/49 – 2020 සැප්තැම්බර් 18 වැනි සිකුරාදා – 2020.09.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩගම්පහ කෝරළේ සුළු කොට්ඨාසයේ, ලුණුකැටියාමඩිත්ත (709) ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ලුණුකැටියාමඩිත්ත ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක Maha/KND/2018/145 හා 2018.07.31 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ලට මායිම්:

2. **පරවශ්‍යතාවේ විස්තරය.-** කුණ්ඩසාලේ - හාරගම ජල සම්පාදන ව්‍යාපෘතියේ බුළුවේමුදුන සේවා ජලාශයේ ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක පරවශතා අයිතිය අත්කර ගැනීම :

01. කැබලි අක්ෂර 'A' – ලුණුකැටියාමඩිත්තහේන – ප්‍රමාණය: **හෙක්. 0.0237 ක් පමණ**

උතුරට: එන්. එම්. ආරියරත්න හිමිකම් කියන ලුණුකැටියාමඩිත්තහේන, ඩී. ජී. එම්. පී. විජේසිරි හිමිකම් කියන ලුණුකැටියාමඩිත්තහේන සහ මාර්ගය; නැගෙනහිරට: හිමිකරු නොදන්නා ලුණුකැටියාමඩිත්ත හේන සහ එම්. ආරියරත්න හිමිකම් කියන ලුණුකැටියාමඩිත්ත හේන; දකුණට: එන්. එම්. ආරියරත්න හිමිකම් කියන ලුණුකැටියාමඩිත්ත හේන, හිමිකම් නොදන්නා ලුණුකැටියාමඩිත්ත හේන සහ මාර්ගය; බටහිරට: එම්. ආරියරත්න හිමිකම් කියන ලුණුකැටියාමඩිත්ත හේන සහ එන්. එම්. ආරියරත්න හිමිකම් කියන ලුණුකැටියාමඩිත්ත හේන.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය : 4-3/9/2017/WS/210.
2020 මාර්තු මස 12 වැනි දින,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

10 - 94